# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2097/14 - 2018 නොවැම්බර් මස 13 වැනි අඟහරුවාදා - 2018.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/10/66/2012

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.06.11 දිනැති හා අංක 1866/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.05.12 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නුගේගොඩ, ගංගොඩවිල, වලව්වත්ත පාර, නො. 43/28 හි පදිංචි එන්. ඩබ්. ප්‍රේමවතී මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් පානදුර, මෝදරවිල, කර්මාන්තපුරය, අංක 43/3 හි පිහිටි ට්‍රෙන්ඩ් සෙටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.08.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ඔක්තෝබර් මස 22 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/10/66/2012

කාර්මික අධිකරණයේ දී ය.

එන්. ඩබ්. ප්‍රේමවතී මිය,
අංක 43/28, වලව්වත්ත පාර,
ගංගොඩවිල,
නුගේගොඩ.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය : A 3560 සහ

(ට්‍රෙන්ඩ් සෙටර්ස් (ප්‍රයිවට්) ලිමටඩ්,
මහමේසවත්ත, මහරගම)

වත්මන් ලිපිනය

ට්‍රෙන්ඩ් සෙටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 43/3, කර්මාන්තපුරය,
මෝදරවිල,
පානදුර.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානය.

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණි ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2014.05.12 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

*ආරවුලට තුඩුදුන් කාරණය.*

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස්වරයා විසින් 2014.04.09 දින එවා ඇති ලිපියේ දැක්වෙන්නේ,



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ආයතනය වසා දැමීමෙන් පසු 1971 අංක 45 දරන සේවකයන්ගේ සේවය අවසන් කිරීමේ විශේෂ විධිවිධාන පනතට අනුව එන්. ඩබ්. ප්‍රේමවතී මහත්මියට වන්දි මුදල් ලබා නොදීමෙන් ඇයට අසාධාරණයක සිදු වී ඇත්ද? එසේ සිදු වී ඇත්නම් ඇයට හිමි විය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.

**පසුබිම**

ඉල්ලුම්කාරිය විසින් 2014.07.08 දින පළමු තොරතුරු ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී. වගඋත්තරකාර පාර්ශ්වය විසින් 2014.09.08 වන දින ඊට පිළිතුරු ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී. 2014.09.23 වන දින පළමු පාර්ශ්වය ප්‍රති පිළිතුරු ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී.

2014.10.20 වන දින විමසීම් ආරම්භ කරන ලද අවස්ථාවේ වගඋත්තරකාර පක්ෂය මූලික විරෝධතාවයක් මතු කරමින් ඉල්ලීම කාලාවරෝධී වී ඇති බවත් ඉල්ලුම්කාරිය වෙනුවෙන් බලයලත් නියෝජිත අත්සන් කිරීම නීතියට පටහැනි බවත් දක්වන ලදී. ඉල්ලුම්කාරිය වෙනුවෙන් ශ්‍රේෂන් සිල්වා මහතා කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව බේරුම්කරණය ඉදිරියේ නියෝජිතයන්ට පවරා ඇති බලය අනුව පිළිතුරු ප්‍රකාශය අත්සන් කළ බවත් විශේෂයෙන් 4(1) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් බේරුම්කරණයට පත් කර ඇති ආරවුල කාලාවරෝධී වී නොමැති බවත් කියා සිටී. එම අවස්ථාවේ දී මා විසින් ඉල්ලුම්කාරියට නඩුව ආරම්භ කිරීමට අවසර දී සමථයක් සම්බන්ධ හැකියාව දන්වන ලදී. මෙම නඩුවේ දී ඉල්ලුම්කාරිය වෙනුවෙන් ඉල්ලුම්කාරිය සහ කම්කරු නිලධාරී ඩී. එම්. ටී. පී. දසනායක මහත්මිය සහ සහකාර කොමසාරිස් එස්. එම්.පී. නන්දසේන මහතා ද වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් මානව සම්පත් හා පරිපාලන කළමණාකරු වඩුගේ සංජය නයනජිත් මහතා සහ වගඋත්තරකාර ආයතනයේ චමනී තනූජා රාමසිංහ යන අය ද සාක්ෂි දෙන ලදී.

අවසානයේ දී දෙපාර්ශ්වය විසින් ලිඛිත දේශනය ගොනු කරන ලදී. මෙම නඩුවේ පසුබිම සලකා බලද්දී ඉල්ලුම්කාරිය ආයතනයේ සේවයට බැඳී ඇත්තේ වර්ෂ 1990.10.14 වන දින දී වන අතර 2007.04.10 වන දින සිංහල අවුරුදු උත්සවය සඳහා කර්මාන්ත ශාලාව නිවාඩුවට වසා දමන අතර පසුව 2007.04.18 වන දින ඉල්ලුම්කාරිය සේවයට යන අවස්ථාවේදී සේවා ස්ථානය පානදුර මෝදරවිල ප්‍රදේශයට මාරු කර ඇති බවත් සේවය සඳහා එහි යන ලෙසත් පාලන අධිකාරිය දන්වන ලදී.

ඉල්ලුම්කාරිය ගංගොඩවිල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකාරියක වන බැවින් නව සේවා ස්ථානය වූ පානදුර මෝදරවිලට යාම අසීරු කරුණක් විය. එම නිසා ඇය නව සේවා ස්ථානයට සේවය වාර්තා කිරීමට නොගිය බව සඳහන් කරන ලදී.

මෙම නඩුවේ ඉල්ලුම්කාරිය වගඋත්තරකාර සමාගමේ වසර දහහතක කාලයක් සේවය කළ තැනැත්තියක් වන අතර 2007 වර්ෂයේ දී සේවය අවසන් කිරීමේ පනතට පටහැනිව මහරගම මහමේඝ පාරේ තිබූ කර්මාන්ත ශාලාව පානදුර මෝදරවිල ප්‍රදේශයට ගෙන ගිය බවත් එසේ කිරීම පවත්නා කම්කරු නීති වලට පටහැනි බවට කම්කරු කොමසාරිස්වරයාගේ නියෝගයක් අනුව සේවකයන්ට වන්දි මුදල් ප්‍රදානය කළ බව 2014.07.07 දිනැති වගඋත්තරකාර පක්ෂය ගොනු කළ ලිපිය අනුව පැහැදිලි වේ. තවද කම්කරු නිලධාරී ශාන්ත කුමාර මහතා 2013.03.21 සහ 2013.04.24 යන දිනයන්හි පවත්වන ලද විමර්ශනය සම්බන්ධයෙන් වගඋත්තරකාර ආයතනයේ සමූහ මානව සම්පත් හා පරිපාලන කළමනාකාර සංජය නයනජිත් මහතා පැහැදිලිව ප්‍රකාශ කර ඇත්තේ 2007.08.24 වන දින ඉල්ලුම්කාරියට හිමි පාරිතෝෂික දීමනා ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ අංක 852628 දරන චෙක්පතකින් ගෙවූ බව අවධාරණය කරන ලදී.

විශේෂයෙන්ම 2014.09.08 වන දින සමූහ මානව සම්පත් නිලධාරී තැන තොරතුරු ප්‍රකාශයට පිළිතුරු දෙමින් පැහැදිලි කර ඇත්තේ මුල් තත්වයට හාත් පසින් වෙනස් වූ තත්වයකි. ඒ අනුව ඉල්ලුම්කාරියගේ සේවය 2007.04.10 වන දින අවසන් නොවූ බවත් සිදු වූයේ ස්ථාන මාරුවක් පමණක් බවත්ය. විශේෂයෙන්ම ඉල්ලුම්කාරිය TEU/A/36/2007 නඩුවට කිහිප දිනක්ම පෙනී සිටි බව ප්‍රකාශිතවම පිළිගෙන ඇත.

ඉල්ලුම්කාරියගේ ස්ථාවරය වූයේ ඉල්ලුම්කාරියට ස්ථාන මාරුවක් කරන බවට ලිඛිතව හෝ වාචිකව කිසිම දැනුම් දීමක් නොකළ බවයි. මෙම නඩු විභාගයේ දී හොඳින් තහවුරු වූ කරුණක් වූයේ සේවය අවසන් කිරීමේ පනත යටතේ සේවය අවසන් කිරීම නීත්‍යානුකූල නොවන බවට කම්කරු කොමසාරිස්වරයාගේ තීරණය අනුව සේවකයන්ට වන්දි ප්‍රදානය කිරීම සිදු කළ බවයි.

ඉල්ලුම්කාරිය නඩු විභාගයට සහභාගිවූ බව වගඋත්තරකාර පක්ෂය පිළිගන්නා අතරම ඉල්ලුම්කාරියට හැර සියලු සේවකයන්ට වන්දි ප්‍රදානය කළ බවත් ප්‍රකාශ කර සිටී. වගඋත්තරකාර පක්ෂයේ ස්ථාවරය අනුව ඉල්ලුම්කාරියට ස්ථාන මාරුවක් දුන්නේ නම් ඇය සේවය භාර නොගැනීම මත නොදන්වා සේවයට නොපැමිණීම මත VOP යටතේ සේවයෙන් අස්කළ යුතුව තිබුණි. වගඋත්තරකාර සමාගම සියලුම සේවකයන්ට වන්දි ප්‍රදානය කළ බව ප්‍රකාශ කරන අතරම ඉල්ලුම්කාරිය ඉල්ලීමක් නොකළ බැවින් ඇයට වන්දි ලබා දීමට අයිතියක් නොමැති බව දක්වා ඇත. තවද අනවශ්‍ය ලෙස ප්‍රමාද වී ඉල්ලීම සම්බන්ධයෙන් ද බරපතල ලෙස චෝදනා නගා ඇත.

විශේෂයෙන් ම බේරුම්කරණයකදී මූලික වශයෙන් අදාළ කරගන්නේ සාධාරණත්වයේ මූලධර්ම බැවින් ඉල්ලුම්කාරිය සද්භාවයෙන් යුතුව මෙම ඉල්ලීම කර ඇත්තේ පෙර සඳහන් කරන ලද TEU/A/36/2007 නඩු විභාගයට කිහිප වතාවක් පෙනී සිටියද ඇයට වන්දි නොලැබුණු නිසාත්, සේවකයන්ගේ ලැයිස්තුවේ තවත් ප්‍රේමවතී යනුවෙන් කෙනෙකු සිටීමෙන් ප්‍රශ්නය පටලැවී ඇති බව හෙළිදරව් වීමත් හේතුකොට ගෙනය. මෙහිදී සළකා බැලිය යුත්තේ ඉල්ලුම්කාරිය සිය අයිතිවාසිකම් උදෙසා නිසි කලට නිසි ලෙස ඉදිරිපත් වූයේ ද යන්නයි. සමස්ථ විභාගය පුරාම ඇය සිය අයිතිවාසිකම් වෙනුවෙන් ඉදිරිපත් වූ බව අවිවාදයෙන් තොරව පිළිගත හැකිය. නිවැරදි ලෙස ඇයගේ නම සඳහන්ව නොතිබීම සම්බන්ධයෙන් වගකීව යුතු වන්නේ පෞද්ගලිකව ඉල්ලුම්කාරිය නොව මුල සිට විමර්ශනයට සහභාගි වූ පාර්ශ්වයන් බව නිගමනය කරමි.

වගඋත්තරකාර පක්ෂය පිළිගන්නා පරිදි ඉල්ලුම්කාරියට වන්දි මුදල් ප්‍රදානය නොකළේ නම් කාර්මික ආරවුල් පනතේ ප්‍රතිපාදන මත සාධාරණ සහ යුක්තිසහගත තීන්දුවක් ලබා දීම අනිවාර්ය වේ.

විශේෂයෙන්ම වගඋත්තරකාර පක්ෂය බරපතල ලෙස කාල ප්‍රමාද වී මෙම ඉල්ලීම කළ බවට දක්වන විරෝධතාවය ඉහත දක්වන

කරුණු අනුව පිළිගත නොහැක. දෙවන විරෝධතාවය ලෙස දක්වා ඇත්තේ ඉල්ලුම්කාරියගේ ප්‍රති පිළිතුරු ප්‍රකාශයේ ඉල්ලුම්කාරිය වෙනුවට ඇයගේ නියෝජිත ශ්‍රේෂන් සිල්වා මහතා අත්සන් කිරීම මත එය ඉවත දමන ලෙස දක්වා තිබීමයි. ප්‍රති පිළිතුරු ප්‍රකාශය ඉවත දැමුවද ඉල්ලුම්කාරියගේ මුල් තොරතුරු ප්‍රකාශයන් ඉදිරිපත් කරන ලද සාක්ෂි සහ ලේඛන ද සළකා බැලීමේදී ඉල්ලුම්කාරියට සේවා කාලය වෙනුවෙන් වන්දි ලබා දීම සාධාරණ සහ යුක්ති සහගත බවට තීරණය කරමි.

*ප්‍රදානය*

1. ඒ අනුව විත්තිකාරියගේ වසර දහහතක සේවා කාලය සඳහා අනෙක් සේවකයන්ට වන්දි මුදල් ගෙවන ලද සූත්‍රය පදනම් කරගෙන වන්දි ගෙවිය යුතු ය.

2. දීර්ඝ කාලයක් බේරුම්කරණයේ විභාග කටයුතු වලට සහභාගි වීම නිසා ඉල්ලුම්කාරිය වෙත වගඋත්තරකාර පක්ෂය විසින් නඩු ගාස්තු වශයෙන් රුපියල් විසිපන්දහසක (රු. 25,000/-) මුදලක් ගෙවිය යුතු ය.

3. මෙකී ප්‍රදානයන් ගැසට් පත්‍රයේ පළ වූ දින සිට මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු ය. මුදල් මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

*සටහන*

මෙම බේරුම්කරණ විභාගයට සෑහෙන කාලයක් ගත වූයේ දෙපාර්ශ්වයම වරින් වර දින ඉල්ලා කරන ලද ඉල්ලීම්වල ප්‍රතිඵලයක් හැටියටය, විශේෂයෙන් ම මෙම ප්‍රදානය සකස් කොට ඉදිරිපත් කිරීම ප්‍රමාද වූයේ නොවැළැක්විය හැකි අති පෞද්ගලික හේතුන් නිසා බවත් ඒ සම්බන්ධයෙන් දෙපාර්ශ්වයට ම කිසියම් අපහසුතාවයක් වූයේ නම් පෞද්ගලිකව අතිශයින්ම කණගාටුවට පත් වෙමි.

එස්. එම්. එස්. ජයවර්ධන,
බේරුම්කරු.

2018.08.16 වන දින,
කාර්මික අධිකරණයේ දී ය.

11 - 1182

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.